## සිකුරාදා

පළමුවන කියැවීම ප්‍රඥා 13: 1–9

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් ගත් පාඨයෙකි.

"ඔවුහු නිර්මාතෘවරයාණන් නොහඳුනන්නෝ ය."

දෙවිඳුන් නාඳුනන සියලු මනුෂ්‍යයෝ සැබැවින් ම මෝඩයෝ ය. එවැනි අය දැක්ක හැකි දේවලින් ස්වයම්භූ තැනැත් වහන්සේ නොදකින්නෝ ය. සොයන්නට නොහැකි වූ එතුමාණන්ගේ නිර්මාණයන් හඳාරන නමුත්, ඔවුහු නිර්මාතෘවරයාණන් නොහඳුනන්නෝ ය. ලොව පාලනය කරන දෙවි වරුන් මෙන් ඔවුන් සලකා ඇත්තේ ගින්න ය, සුළඟ ය, කුණාටුව ය, තාරකා මණ්ඩල ය, වේගවත් ජලය යඃ එසේත් නැත්නම් අහසේ ප්‍රදීපයෝ ය.

ඒවායේ ශෝභමාන තත්ත්වයෙන් වසඟ වී ඔවුන් ඒවා දෙවිවරුන් මෙන් සලකා තිබේ නම්, ශෝභනත්වයේ කර්තෘවරයාණන් ඒවා මවා ඇති බැවින් ඒ සමිඳාණෝ ඒවා කෙසේ අභිබවා යන සේක් දැ යි මිනිස්සු තේරුම් ගනිත්වා!

ඒවායේ බලවේගයෙන් ඔවුහු විස්මිත වී සිටින්නෝ නම්, ඒවා මැවූ තැනැත් වහන්සේ කොපමණ බලවත් දැ යි නිගමනයට බසිත්වා!

මන්ද, මැවිල්ලේ තේජස හා ශෝභනත්වය සසඳා ඒවායේ කර්තෘවරයාණන් ගැන කල්පනා කළ හැකි ය. එහෙත් මොවුන්ට එතරම් දොස් පැවරිය නොහැකි ය. මන්ද, ඔවුහු වනාහි දෙවිඳුන් සොයා යාමෙන් සහ එතුමාණන් සොයා ගැනීම පිළිබඳ දැඩි ආශාවෙන් මංමුළා වී ගොස් ඇත්තෝ පමණකි.

එතුමාණන්ගේ ක්‍රියාවන් අතර ජීවත් වෙමින් මේ ක්‍රියා තේරුම් ගැනීමට වෑයම් කරමින් මෙපමණ ශෝභනත්වයක් දැක පෙනුමෙන් රැවටී, ඔවුහු එයට ගොදුරු වෙති.

එහෙත්, ඔවුන්ට පවා කමා කළ යුතු නැත. ලෝකය නිරීක්ෂණය කිරීමට හැකි වන පරිදි මෙතරම් නැණ නුවණ ලබාගන්නට පුළුවන් නම්, ඔවුන් එහි ස්වාමින් සොයා ගැන්මට පවා වූයේ කෙලෙස ද?

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 19: 1–4

පිළිතුර : අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය.

ගීය :

අහස් තලය දෙවි මහිමය ප්‍රකාශ කරන්නේ ය.
ගුවන් තලය එතුමන්ගේ අත්කම් විදහා පාන්නේ ය.
එක දිනක් තව දිනකට මෙපුවත කියන්නේ ය.
එක් රැයක් තව රැයකට එය ම පවසන්නේ ය.

කතාවක් වදනක්, කිසියම් හඬක් ඇසෙන්නේ නැති වුව ද
ඒ පණිවුඩය ලොව පුරා පැතිරී යන්නේ ය.
ඒ දියත දසත විහිදී යයි.

සුපුවත් ජය නද හෙබ්‍රෙව් 4: 12

ආලේලූයා! ආලේලූයා!
දේව වචනය ජීවමාන ය. ක්‍රියාශීලී ය.
සිතේ සිතුවිලි ද, අරමුණු ද, විමසන්නේ ය
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද ලූක් 21: 28

ආලේලූයා! ආලේලූයා!
"ඔබේ විමුක්තිය ළං වෙගෙන එන බැවින්,
නැගී සිට හිස ඔසවන්නැ" යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 17: 26-37

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"මනුෂ්‍ය පුත්‍රයාණන් ප්‍රකාශ වන දිනයේදීත් ඒ අයුරින් ම වන්නේ ය."

නෝවාගේ දවස්වලදී වූ ලෙසම, මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ දවස්වල දීත් වන්නේ ය. නෝවා නැවට පිවිසුණු දිනය දක්වා මිනිස්සු කමින්, බොමින්, අවාහ විවාහ වෙමින් කල් යැවූහ. එවිට ජල ගැල්ම පැමිණ ඔවුන් සියල්ලන් විනාශ කර දැමී ය. ලොත්ගේ දවස්වල දීත් එසේ ම විය. ඔවුහු කමින්, බොමින්, වෙළ හෙළඳාම් කරමින්, වවමින්, ගෙවල් සාදමින් කල් යැවූහ. එහෙත් ලොත් සොදොම්හි සිට නික්ම ගිය ද, අහසින් ගිනි හා ගෙන්දගම් වැසි වැස, සියල්ලන් විනාශ කර දැමීය. මනුෂ්‍ය පුත්‍රයාණන් ප්‍රකාශ වන දිනයේ දීත් ඒ අයුරින් ම වන්නේ ය. ඒ දවසේ දී ම පියස්ස මත සිටින්නා ගෙයි තිබෙන තම බඩු බාහිරාදි ගෙන යනු පිණිස බිමට නොබසීවා. එසේ ම කෙතේ සිටින්නා පෙරළා නොඒවා. ලොත්ගේ භාර්යාව සිහි කරන්න. සිය ජීවිතය රැක ගන්නට සොයන්නා එය නැති කර ගන්නේ ය. සිය ජීවිතය නැති කරගන්නා එය රැක ගන්නේ ය. මෙය ඔබට කියමි. ඒ රැයේ දී මනුෂ්‍යයන් දෙදෙනෙක් එක යහනත සිටියි. එක් කෙනෙක් ගනු ලබන්නේ ය. අනෙකා හැර දමනු ලබන්නේ ය. ස්ත්‍රීහු දෙදෙනෙක් එකට ධාන්‍ය අඹරමින් සිටිති. එක තැනැත්තියක් ගනු ලබන්නී ය. අනෙක් තැනැත්තිය හැර දමනු ලබන්නී ය. මනුෂ්‍යයන් දෙදෙනෙක් කෙතෙහි සිටිති. එක් කෙනෙක් ගනු ලබන්නේ ය. අනෙකා හැර දමනු ලබන්නේ ය. එවිට ඔවුහු උත්තර දෙමින්, "ස්වාමිනි, ඒ කෙතෙහි දැ" යි උන් වහන්සේගෙන් ඇසූහ. උන් වහන්සේ උත්තර දෙමින්, "මළකඳ කොතැන ද, ගිජු ලිහිණියෝ එතැන රැස්වෙති" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.